**රජයේ නිවේදන**

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

**3 වැනි වගන්තිය යටතේ නියමය**

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින් ජාතික හැඳුනුම්පත් අංක 332310097V දරන ජනරාල් (විශ්‍රාමික ) හැමිල්ටන් වනසිංහ විසින් ආනයනය සහ නිදහස් කරගන්නා ලද චැසි අංක MR0KB8CC401054677 හා එන්ජින් අංක 2GD-0416778 දරන මෝටර් රථය ආනයනය මත එකතු කළ යුතු, අයකළ යුතු සහ ගෙවිය යුතු නිෂ්පාදන බදු අනුපාතය 2017 නොවැම්බර් මස 09 දිනැති හා අංක 2044/32 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ විශේෂිතව දක්වා ඇති ගෙවිය යුතු නිෂ්පාදන බද්දෙන් 35% ක් බව ප්‍රකාශය පත් කරමි. ආනයනය කරන ලද වාහනය ප්‍රතිලාභියාගේ නමින් ලියාපදිංචි කල යුතු අතර ලියාපදිංචි දිනයේ සිට වසර 05 ක් ගත වන තුරු අන් අයෙකුට පැවරීම සිදු නොකල යුතුයි. ඉහත සහනදායී නිෂ්පාදන බදු අනුපාතය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි ලබාදෙන ලදී.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.